## විල්පත්තු මහ විනාශය ගැන නිරීක්ෂණ වාර්තාව

පසුබිම - "විල්පත්තුව විනාශයි ජාතික වනෝද්‍යානයේ ගස් කපා විනාශ කර ඇත. මේවා සිදු කර ඇත්තේ එම ප්‍රදේශයට පදිංචියට පිටින් පැමිණි මුස්ලිම් ජාතිකයන් පිරිසක්ය". ආදී වශයෙන් පසුගිය මැයි මාසය මුල සිට දැවැන්ත ප්‍රචාරයක් සිදු විය. විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය වලින් මේ ගැන සාකච්ඡා ප්‍රවෘත්ති ආදිය පළවිය. එහෙත් ඒ ප්‍රචාර වල ප්‍රශ්ණයට ගොදුරු වී සිටි මුස්ලිම් ජනතාවගේ අදහස් පළවුයේ නැති තරම්ය. එහෙත් ඊට අදාල රජයේ නිළධාරීහු සහභාගි වූහ. භික්ෂුන් ඇතැම් සමහර පිරිස් උද්ඝෝෂණ සහ උපවාස පවත්වමින් පෙන්වූයේ යම් පිරිසක් වන විනාශය කරන බවත් ඒ සමග දේශපාලකයන්ද සිටින බවත්ය. එහෙයින් වන විනාශයක් ඇතැයි කියන ඡායාරූප සහ විස්තර පළවූ ප්‍රදේශයට ගොස් ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරිමට ඉමඩා ආයතනයේ ආරාධනයෙන් පිරිසක් සහභාගි වූහ.

අපට තොරතුරු ලැබුණේ මන්නාරම් ප්‍රදේශයේ මුසලි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් පාලක්කුලි මරිච්චික්කට්ටි කරඩික්කුලි ගම් තුන සම්බන්ධයෙනි. මෙයින් වැඩිපුර ප්‍රචාරයට ලක්වූයේ මරිච්චික්කට්ටි ග්‍රාමයයි.

1990 වන විට ත්‍රස්තවාදී ප්‍රහාර නිසා පාලක්කුලියේ පවුල් 75 ක් ද මරිච්චික්කට්ටි පවුල් 150ක් ද කාරඩික්කුලිහි පවුල් 100 ක් ද වශයෙන් පවුල් 325 ක් අවතැන් වී ඇත. දැන් ඔවුන් තමන් උන් හිටි තැන් වලට යලි පදිංචියට පැමිණ ඇත. නැත්නම් පැමිනීමට නියමිතව ඇත. ආරවුලක් ඇතැයි ප්‍රචාරය වන්නේ මේ සංසිද්ධිය සම්බන්ධයෙනි. මේ පවුල් 325 යළි තමන්ට හිමිකම් තිබුණු භූමියට ආපසු පැමිණෙන විට අවුරුදු 25 ක් ගත වී ඇත. ඒ ඔවුන් සිටි ගෙවල් දොරවල් වත්ත පිටිය වසාගෙන කැලෑ වැවිලාය. පවුල් අතු පවුල් අනු පවුල් වශයෙන් වර්ධනය වී ඇත. දැනට මේ ගම් තුනේ ලියාපදිංචිය පවුල් 1321 කි. තවත් 30 ක් පමණ ලියාපදිංචි වීමට ඇත.

ගැටලු ඇති වීම - මොවුන්ගේ පදිංචිය ඉඩම් වෙන් කිරීම සම්බන්ධ ගැටලුව පැන නගින්නේ මෙහි පදිංචියට හිමිකම් ඇති මුස්ලිම් ජනතාවගෙන් නොව පසුගිය ආණ්ඩුවේත් දේශපාලකයන්ගේත් ක්‍රියාවන් නිසාය. ගැටලුව ඇති වීමට බෙහෙවින් හේතු වන්නේ නාවුක හමුදා කඳවුරේ පිහිටිමය ඉඩම් ඔප්පු සහ බලපත්‍ර ලබා ඇති අයගේ ඉඩම් වලින් අක්කර 400 ක නාවුක හමුදා කඳවුර පිහිටා තිබේ. ගම්මුන්ගේ පැරණි සුසාන භූමියේ අක්කර 12 ක් එම හමුදා කඳවුර විසින් වටකරගෙන තිබේ.

මෙහි කලින් පදිංචි කරුවන්ට ඒ සඳහා කිප ආකාරයකින් බලය ලැබී ඇත.

1) සමහර පැරණි අයට 1924 තරම් ඈත කාලයේ ඉංග්‍රිසි ආණ්ඩුවෙන් ඔප්පු ලැබි දැන් එය ඔවුන්ගේ පැවතෙන්න්ට හිමිය.

2) 1988 දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගෙන් ප්‍රදාන පත්‍ර ලැබී හිමිකම් තහවුරු වූ අය වෙති. එම ප්‍රදාන පත්‍ර ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පැවරුණු ඒවාය. මන්/ප්‍ර/2851 මරිච්චික්කට්ටි හි පදිංචි අයි උතුමා ලෙබ්බේ - 1988 ජුනි 22 දා ලැබුණු ප්‍රධාන පත්‍රයෙන් හිමි වූ ඉඩම දැන් ඔහුගේ පැවතෙන්නන් බුක්ති විදිය යුතුය. මෙවැනි තවත් ප්‍රදාන පත්‍ර හිමියෝ සිටිති.

3) හිටපු ජනාධිපති ප්‍රේමදාස මහතා අගමැති - පළාත් පාලන නිවාස සහ මහා මාර්ග ඇමතිකාලයේ පවරා දුන් ස්ථිර නිවාස 10ක් දැන් වල් බිහිවී ඇත. 1980/07/22 දින එම නිවාස යෝජනා ක්‍රමය විවෘත කර ඇත. එම නිවාස අලුත් කොට හිමිකරුවන්ට පවරා දිම සිදුවිය යුතුව තිබුණු මුත් එසේ සිදුවී නැත. එම නිවස පසු කළ විට විල්පත්තු අභය භූමියේ ප්‍රවේශය ඇත. දැනට වනජිවී නිලධරයන්ගේ බංගලාවක් ඇත. එම බිම් කොටස් විල්පත්තු වනයට අයත් නම් එහි 1980 වැනි කාලයක දී ගෙවල් ( ස්ථිර නිවාස) හැදිමක් සිදුවිය හැකිද?

යුද්ධයට පසු - 2009 යුද්ධය අවසන් වීමත් සමග නැවත උන් හිටි තැන් වල පදිංචි වීමේ අවශ්‍යතාව අදාළ බලධාරින්ට මිනිසුන් විසින් දන්වා ඇත. ඒ අනුව වරින් වර ලියුම් හුවමාරු වී ඇත. මරිච්චිකට්ටි සංවර්ධන හා යලි පදිංචි කරවීමේ සංවිධාන මුසලි ප්‍රාදේශිය ලේකම් වෙත යැවුණු ලිපියක් අනුව අක්කර 50 ක භූමියක් අනුමත කළ බව දැක්වේ.

වනජීවී දෙපාර්තමේන්තුවේ EMDL/04/02/08/11/2012 සහ 08/05/2013 දරණ ලිපිය මගින් මරිච්චිකට්ටි ජනතාවට පදිංචිවීමට අවශ්‍ය බිම් ප්‍රමාණය නිදහස් කළ බව දැක්වෙන මුසලි ප්‍රාදේ/d/08/05/2013 දරණ ලිපිය මගින් මරිච්චිකට්ටි ජනතාවට පදිංචිවීමට අවශ්‍ය බිම් ප්‍රමාණය නිදහස් කළ බව දැක්වෙන මුසලි ප්‍රාදේශිය ලේකම් ගේ MU/DS/Land/Re/2012 සහ 12/01/2014 දිනය දරණ මුසලි ප්‍රාදේශිය ලේකම් ගේ ලිපියද ජනතාව සතුව ඇත. මේ පදිංචිය සම්බන්ධ  කරුණ ගැන අවුරුදු කිහිපයක්ම මුසලි ප්‍රාදේශිය ලේකම්වරයා වනජිවි දෙපාර්තමෙන්තුව මුල්ලිකුලම නාවික හමුදා රෙයර් අද්මිරාල්වරයා සහ අමාත්‍යාංශය සමග ලියුම් ගණුනෙු කර ඇත. මාධ්‍යයෙන් පෙන්වූ පරිදි හදිසි කැලෑ එළි කිරීමක් නොවේ.

නාවුක කදවුර පිහිටුවීමේ දී - ඔප්පු සහ වෙනත් බලපත්‍රලාභීන් 32 කුගේ ඉඩම් ඊට යටවී ඇති බව 2012 දී අද්මිරාල්වරයාට දන්වා ඇත.

මරිච්චිකට්ටි ගම් වැසියන්ගේ පාරම්පරික ඉඩම් අක්කර 450 ක් නාවුක කදවුරට යටවී ඇති බව ඔවුන් සතු ලිපි ලේඛණ සාක්ෂි දරයි. කරුංකාලිමොට්ටායි තිඩල් නම් ඉඩම ජනතාවට පදිංචි වීම සඳහා ප්‍රා.ලේ අනුමැතිය දී ඇතත් වනජීවී දෙපාර්තමෙන්තුව එහි පදිංචිවීම තහනම් කර ඇත. මෙය සිදුවූයේ 2014 දීය ඉන්පසුව තලෙයිවිල්ලු අතර පිහිටි ඉඩමක් අනුමත කර ඇත. එහෙත් ශ්‍රී ලංකා යුධ හමුදාව එහි පදිංචි වීම තහනම් කර ඇත. මේ තහනම් කිරීම් සිදුවූයේ බිම් සැකසීමට රු 50 ලක්ෂයක් පමණ වියදම් වූ පසුවය වනජීවි දෙපාර්තමෙන්තුවට අයත් පරිවාර ඉඩම් වල පදිංචි වීම තහනම් කිරීම නීත්‍යානුකූලය මිනිසුන් පදිංචි කරවීම සඳහා සමහර දේශපාලකයන් මැදිහත් වී ඇත්තේ තම දේශපාලන අරමුණු ඉටුකර ගැනීමටය. එහෙත් මේ අනාථ වූ පවුල් වලට ඒ නිසා අසාධාරණයක් සිදුවිය යුතු නැත. දේශපාලකයන් මැදිහත්වීම නිසා අනෙක් පැත්තෙන් ජාතිවාදී අදහස් වැපිරවීමටද යම් පිරිසක් ඉදිරිපත් වූහ. එහෙත් මේ නිසා විශාල අසාධාරණයක් සිදු වූයේ සාමාන්‍ය ජනතාවටය.

කෙසේ වෙතත් මේ පිරිසට පදිංචි වීම සඳහා නිවාස තනා දීමට මැදපෙරදිග පරිත්‍යාගශීලියෙකු ඉදිරිපත්ව ඇත. නමින් අල් ජාසින්ය. මේ ගැනද සමහර මාධ්‍ය සැක මතු කර ඇත. එහෙත් එයද 2012 සිටම සිදුවූවකි. අල් ජාසින් ෆෙඩරේෂන් රිසර්ච් ඇන්ඩ් ඩිවලොප්මන්ට් නමින් රාජ්‍ය නොවන සංවිධානයක් මගින් ස්ථිර නිවාස 300ක් පමණද පල්ලියක්ද අල් ජාසින් විද්‍යාලයද සාදා නිමකොට ඇත. එහෙත් තවමත් පදිංචියට පහසුකම් නැත. එම නිවාස සාදා ඇති ප්‍රදේශය විල්පත්තු වනයට හෝ රජයේ කැලෑ වලට අයත් නැති රජයේම ඉඩම් සහ පෞද්ගලික ඉඩම් තිබුණු ප්‍රදේශයකි.

අපගේ නිරීක්ෂණයට හමුවූයේ මෝදරගම් ආරු සහ කල්ලාරු ගංගා ආසන්න මරිච්චිකට්ටි ගම් ප්‍රදේශයයි. මෙ ගම කෙළවරේ මෝදර ගං පාලම උඩ උපවාසයක් සහ උද්ඝෝෂණයක් පැවැත්වී ඇත. එහෙත් එම උපවාසය පැවැත්වුණු පාලමෙන් එහා විල්පත්තු වනජීවි දෙපාර්තමෙන්තුවේ නිලධාරීහු රැකවලේ සිටිති. එම රැකවල් ප්‍රදේශ තුළ ඡායාරූප සහ විස්තර ආදියෙන් දැක්වුණු වන විනාශය සිදුවූ වෙනත් ප්‍රදේශ සහ මෙම ප්‍රචාර වලට සහ උද්ඝෝසණ වලට ගොදුරු නොවූ වෙනත් ප්‍රදේශ ඇත.

එම ප්‍රදේශ වල වන විනාශය සිදුවන්නට පටන්ගෙන ඇත්තේ 2010 සිටය. එනම් මන්නාරම පෙරියමඩු ප්‍රදේශය ඉන් එකකි. 1990 යුද්ධය නිසා එම ප්‍රදේශය හැර ගිය පිරිස දැන් ආපසු පැමිණ ඇත. 2012 සිට එහි පිරිසක් පැමිණ ඇත. මේ සමහර අය පදිංචි කරවීමේ මුවාවෙන් සමහරුන් වන විනාශය කර ඇත. දැව ජාවාරම් ද සිදුවී ඇත. ඒ එවකට පැවති රාජ්‍ය බලයද යොදා ගැනීමෙනි. ඒ කාලයේත් දැනුත් ඒ සම්බන්ධයෙන් උද්ඝෝෂණ උපවාස සිදුවිය යුතුය. තවත් පැතිවල කොතෙකුත් වන විනාශය සිදුවූවාට සැක නැත. ඒවා ගැන එකල කිසිදු හඬක් නොනැගිණ පරිසරවේදින්ගෙන් යම් විරෝධතාවක් ඇති වුනානම් එය බලහත්කාරයෙන් මර්ධනය වූ බව ප්‍රකට කරුණකි.

මේ පෙරියමඩු හා මරිච්චකට්ටි ප්‍රදේශ පිහිටා  ඇත්තේ දෙපැත්තකිනි. එකිනෙකාට කිලෝමීටර 50 ක් පමණ ඇතිනි. එසේ වන විනාශ කලවුන් ට එරෙහිව තවමත් නීතියෙන් ක්‍රියා කළ හැකිය. එදා ඒවා කරපු දේශපාලනඥයන්ම අද අනෙක් පැත්තට පැමිණ එයම කිරීමට උත්සහ කරනවා විය හැකිය. එහෙත් අප උනන්දු වන්නේ උන්හිටි තැන් නැතිවූ මිනිසුන්ට එම ස්ථාන හා කෘෂි ඉඩම් ලැබීම ගැනය. දේශපාලන හොරුන්ට එරෙහිවීම එකකි. ජාතිවාදී උසිගැන්වීම් මගින් ඔවුන්ට තමන්ගේ ඉඩම් අහිමි කිරීම තව එකකි.

පසුගිය කාලයේ රට පුරාම නීතිවිරෝධි ලෙස වන විනාශ සිදුවූ අවස්ථා ගණන අති විශාලය. එහිදී මෙය ජාතිවාදය වැපිරීමේ සිදුවීමක් නොවීය. මෙය යම් අයගේ මෙය මානුෂිය ප්‍රශ්ණයක් සේ සලකා ඔවුනට හිමි තැන් වලින් බැරිනම් වෙනත් තැනකින් සාධාරණ ලෙස පදිංචි වීමට ඉඩම් ලැබිය යුතුය. දැනටමත් කර ඇති ඉදිකිරීම් නීතිවිරෝධි නොවන බව අපට දැනගනන්ට ලැබුණු තොරතුරු අනුව නිගමනය කළ හැකිය.

එහෙත් මෙම ප්‍රදේශය හමුදාවෙන් සිංහල දෙමළ අය පදිංචි කරවා ඇති මුල්ලිකුලම් වැනි ප්‍රදේශයක් නොවේ. එය පිහිටා ඇත්තේ විල්පත්තුවට අයත් භූමියේය. ඊට පිටින් පිහිටි මෙම ප්‍රදේශයේ එබදු ගැටලුවක් ඇති නොවේ.

මෙය නිරීක්ෂණයට සහභාගිවූවෝ

1) ඉමඩා ආයතනයේ සහය ලබා දෙමින් එහි ක්‍රියාකාරී ටයිටස් ප්‍රනාන්දු මහතා

2) නීතිඥ එස් ජී පුංචිහේවා - ප්‍රජාතන්ත්‍රිය අයිතිවාසිකම් රැකගැනීමේ ව්‍යාපාරය වෙනුවෙන්

3) මහින්ද හත්තක - මාධ්‍යවේදි - ප්‍රජාතන්ත්‍රිය අයිතිවාසිකම් රැකගැනීමේ ව්‍යාපාරයේ ලේකම්

4) එස් සිවගුරුනාදන් - භාෂා පරිවර්තක - ප්‍රජාතන්ත්‍රිය අයිතිවාසිකම් රැකගැනීමේ ව්‍යාපාරය වෙනුවෙන්

5 නිසාම් මහතා - පුත්තලම මානව අයිතිවාසිකම් ව්‍යාපාරය වෙනුවෙන්

( අදාළ සියලු ලියකියවිලි සහ තොරතුරු - මරිච්චිකට්ටි එම් තවුෆික් මවුලවිතුමාගෙන් ලබාගත හැකිය)

(ගමේ තොරතුරු හිටපු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඒ එච් සුෆියාන් මහතා ගෙන් ලබාගත හැකිය -

එස් ජී පුංචිහේවා